Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම්වලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් මොඩියුල අධ්‍යයනය


පළමුවන කඩඉම

මොඩියුල අංක 03


# පන්ති කාමර කළමනාකරණය හා සිසුන් හඳුනා ගැනීම

ආණමඩුව ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මෙම මොඩියුලය කොටස් දෙකකි.

1. පන්ති කාමර කළමනාකරණය

2. සිසුන් හඳුනා ගැනීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මොඩියුලයේ අරමුණු

- කළමනාකරණ සංකල්පය නිර්වචනය කර එළදායී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය හඳුනා ගැනීම.
- ගුරුවරයා පන්ති කාමර ව්‍යාවහාර ගුරු සිසු දෙපිරිසට ම ප්‍රිය උපදවන පරිදි භාවිතා කිරීම.
- විවිධ වයස් කාණ්ඩයන්ට අයත් ශිෂ්‍යයන්ගේ ගති ලක්ෂණ හඳුනාගැනීම.
- ළමයා හා පරිසරය, ළමා සංවර්ධනය, අවශ්‍යතා අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රම වේද භාවිතා කිරීම.
- පන්ති කාමරය තුළ සිසුන්ගෙන් මතු වන අභියෝගාත්මක චර්යාමය ගැටලු කළමනාකරණය කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ඉගෙනුම් ඵල

- පන්ති කාමර කළමනාකරණය යන්න කුමක්දැයි පැහැදිලිව ප්‍රකාශ කරයි.
- කළමනාකරන ක්‍රියාවලියේ පියවරයන් විධිමත් ව පන්ති කාමර කටයුතුවල දී
- භාවිතා කරයි.
- පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ කාර්යභාරය කාර්යක්ෂම ව හා ඵලදායී ව ක්‍රියාත්මක කරයි.
- පන්ති කාමර සිසුන්ගේ මතුවන අභියෝගාත්මක චර්යා ගැටලු අවස්ථාවෝචිත පරිදි කළමනාකරණය කරයි.
- පන්ති කාමරයේ දී හමුවන සිසුන් චර්යාමය විවිධතා අනුව හඳුනා ගනී.
- සිසුන්ගේ විවිධතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස මෙහෙයවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# හැඳින්වීම

- කළමනාකරණය මූලිකවම සමාජ ක්‍රියාවලියකි
- සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සීමිත සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීමට සිදු වේ.
- කළමනාකරණයේ දී සමාජ අරමුණු ඉටු කර ගැනීම සඳහා සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නියාමනය හා ඇගයීම තුළින් ඵලදායීත්වය කරා මෙහෙයවනු ලැබේ.
- පන්ති කාමර ක්‍රියාවලිය සාර්ථක වීමට නම් ගුරුවරුන් පන්ති කාමර කළමනාකරණ කුසලතා වර්ධනය කර ගත යුතු ය.
- වෙනස්වන ලෝකයට දරුවා සූදානම් කිරීමේ වගකීම ගුරුවරයාට පැවරී ඇත.
- ළමයා හඳුනා ගෙන සාර්ථක ඉගෙනුමක් සෑම ළමයෙකුටම ලබාදීම අපේක්ෂා කෙරේ.
- මේ නිසා ළමයා හඳුනා ගැනීමේ හා පන්ති කාමර කළමනාකරණය කර ගැනීමේ හැකියාව ගුරුවරයාට අතිශයින් වැදගත් වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පන්ති කාමර කළමනාකරණය - නිර්වචනය

- කළමනාකරණය යනු සංවිධානයක අරමුණු ඉටු කරගැනීම සඳහා එම සංවිධානයෙහි තිබෙන මානව සහ අනෙකුත් සම්පත් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම යන කාර්යයන් ඇතුළත් ක්‍රියාවලියයි. - ස්ටෝනර් ප්‍රීමන් සහ ගිල්බර්ට් - 1990
- සිසුන් සහිත පන්තියක් මනාව හසුරුවාගෙන යාම පන්ති කාමර කළමනාකරණය ලෙස හැඳින්විය හැකිය. පන්ති කාමර කළමනාකරණය යන සංකල්පය පන්ති පාලනයට වඩා වෙනස් වූ පුළුල් කර්තව්‍යයකි. පාලනය යන්න කළමනාකරණයේදී එක් කාර්යයක් පමණි. එහෙත් පන්ති කළමනාකරණයේදී සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය,සම්බන්ධීකරණය, ගෘහ පාලනය, පෝෂණය ආදී විවිධ කළමනාකරණ කටයුතු කිරීමට සිදුවේ. - ජොන්සන් සහ බෲක් 1997
- හිතකර චර්යාවන් උපස්ථම්භනය කිරීමෙන් ද අහිතකර චර්යාවන් නිරුන්දනය කිරීමෙන් ද පන්ති කාමර පරිසරය සක්‍රිය ලෙස පාලනයට නතු කිරීමේ ක්‍රියාවලිය පන්ති කාමර කළමනාකරණය වේ. - ගිබ්සන් 1981

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කළමනාකරණ ක්‍රියාවලිය

- ලූතර් ගුලික්


  සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය, වා¾තා කරණය,අයවැයකරණය
- ස්ටෝනර්

  සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය කිරීම
- සර්ටෝ

  සැලසුම් කිරීම, සංවිධානය කිරීම, බලපෑම් කිරීම, පාලනය කිරීම
- වර්තමානයේ

  සැලසුම්කරණය, සංවිධානකරණය, නායකකරණය, පාලනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සැලසුම්කරණය

- අරමුණු පිහිටුවා ගැනීම
- අරමුණුවලට අදාළව වර්තමාන තත්ත්වය නිශ්චය කිරීම
- අනාගත තත්ත්වයන් පිළිබඳ පුරෝකථනයන් දියුණු කිරීම
- උපකාරී සැලසුම් පිළියෙළ කිරීම
- සැලසුම් ක්‍රියාත්මක කිරීම
- ප්‍රතිඵල ඇගයීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සංවිධානකරණය

- සම්පත් බෙදා හැරීම
- කාර්ය කොටස් හා අධිකාරිය පැවරීම
- අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයින් සම්බන්ධීකරණය,පුද්ගලයින්ගෙන් උපරිම පරිශ්‍රමයන් ලබා ගැනීම
- ද්වි ගණනයන් වැළැක්වීම
- පුද්ගල කණ්ඩායම් අතර ගැටුම් අවම කිරීම
- සම්පත් නාස්තිය වැළැක්වීම
- මනා සංනිවේදනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නායකකරණය

- සංවිධානයේ, ආයතනයේ අරමුණු ඉටු කිරීම පිණිස බලපෑම් කිරීමේ කලාව
- බලපෑම් කිරීම සඳහා අභිප්‍රේරණය ඉතා වැදගත් වේ.

- නායකත්වය ආකාරලැබෙන
  1. විධිමත් (උසුලන තනතුර ඔස්සේ)
  2. අවිධිමත් (අන්තර් පුද්ගල සබඳතා පවත්වාගෙන යාමේදී කළ හැකි බලය)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නායකත්ව ශෛලි

1. ආඥාදායී

2. ප්‍රජාතන්ත්‍රවාදී

3. වන්නාටවාදී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පාලනය

- සත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිඵලවලට එකඟ බව තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය

- සංවිධාන අරමුණු පදනම් කරගෙන කාර්යඵල, ප්‍රමිතීන් පිහිටුවීම
- සත්‍ය කාර්යඵල මැනීම
- සත්‍ය කාර්යඵල ප්‍රමිතීන් සමඟ සැසඳීම හා ඒ සඳහා නිවැරදි ක්‍රියා මා¾ග ගැනීම
- සැලසුමේ පිහිටුවන ලද අරමුණු සමඟ සැසඳීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පාලන වර්ග

1. ඉදිරි පෝෂණ පාලනය
2. සහගාමී පාලනය
3. ප්‍රති පෝෂණ පාලනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිසුන් හඳුනා ගනීම

- අධ්‍යපන පද්ධතියක සියලු කළමනාකරණ ව්‍යුහයන් රඳා පවතින්නේ ළමයා කේන්ද්‍ර කරගෙනය.
- 1959 එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයට අනුව සෑම රජයක්ම ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලැබීමට ළමයාට ඇති අයිතිය තහවුරු කොට ඇත.
- අනිවාර්ය අධ්‍යාපන කාලසීමා නිර්ණය කර ඇත.(ලංකාවේ අවු. 5-16)
- එ.ජා. සංවිධනයේ ආයතන දෙකක් පිහිටුවා ඇත. 1970 දිවි පැවැත්ම සඳහා ඉගෙනුම වාර්තාව - සෑම දරුවෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කර ඇත.
- කන්නන්ගර ප්‍රතිපත්ති මඟින් සෑම ළමයෙකුටම

මව් බසින් අධ්‍යාපනය ලබාදීම, නොමිලයේ අධ්‍යාපනය ලබාදීම, දිවා ආහාර ලබාදීම, ශිෂ්‍යත්ව ප්‍රදානය - වැනි පියවර මඟින් දරුවන්ට සාධාරණය ඉටු කිරීමට උත්සාහ දරා ඇත.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය

## මාස්ලෝ ගේ අවශ්‍යතා න්‍යාය

- ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතාව
- රසික සම්භවන අවශ්‍යතාව
- ආත්ම සම්මානන අවශ්‍යතාව
- ස්නේහ අවශ්‍යතාව
- ආරක්ෂක අවශ්‍යතාව
- දේහ විද්‍යාත්මක අවශ්‍යතාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිග්මන් ප්‍රොයිඩ් ගේ පෞරුෂ සංවර්ධන න්‍යාය.

- පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනයවීම අවු. 5 ක් වනවිට අවසන් වන බව
- පෞරුෂ සංවර්ධනය ජීව විද්‍යාත්මක පදනමකින් සිදුවන බව
- ළමා සංවර්ධන අවධි 03ක දක්වා ඇත.

1. පූර්ව ලිංගික අවධිය - පිළිසිඳ ගත් දින සිට අවුරුදු 05 දක්වා.
2. ගුප්ත ලිංගික අවධිය - අවු. 05 සිට ගැටවර විය දක්වා
3. වෘද්ධ ලිංගික අවධිය - වැඩිවියට පත්වීමෙන් පසු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ෆ්‍රොයිඩ් ගේ විග්‍රහයේ වැදගත්ම මූලධර්මය - අවරෝධනය
- පූර්ව ලිංගික අවධියේ දී සිදුවන අවරෝධනය පදනම් කරගෙන අනාගතයේ පුද්ගල පෞරුෂය සකස්වේ.
- තෘප්තිමත් නොවූ ආශාවන් නිසා ඔහු ඉච්ඡාභංගත්වයට පත්වේ.
- ඉච්ඡාභංගත්වය සමනය කර ගැනීම සඳහා සංරක්ෂණ ප්‍රයෝග තම පෞරුෂයට එකතු කර ගනී.
- පුද්ගල චර්යාව හැඩ ගැසෙන්නේ සංරක්ෂණ ප්‍රයෝග මතයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යාය

- පියාජේගේ න්‍යායේ වැදගත්ම මූල ධර්මය පරිසරය සමඟ ගැටීම නිසා බුද්ධිය සංවර්ධනය වන බව
- මූලික ලක්ෂණ
  1. සංරක්ෂණ හැකියාව
  2. ප්‍රත්‍යාවර්තන හැකියාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පියාජේගේ න්‍යායට අනුව බුද්ධි සංවර්ධන අවධි

1. ඉන්ද්‍රිය චාලක අවධිය - (අවු. 0 – 02)
2. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය- (අවු.02 – 07)
3. සංයුක්ත චින්තන අවධිය - (අවු.07- 11)
4. විධිමත් චින්තන අවධිය - (අවු. 12 සිට)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධන අවස්ථා

1. ශාරීරික වර්ධනය
2. මානසික වර්ධනය
3. චිත්තවේගීය වර්ධනය
4. සමාජයීය වර්ධනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය පාසල් අවධීන් වශයෙන්

1. පෙර පාසල් අවධිය - අ. 2 – 5

2. ප්‍රාථමික පාසල් අවධිය - අ. 5 - 11

3. ද්විතියික පාසල් අවධිය - අ.11 - 18

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ආරය සහ පරිසරය

- ආරයජීවීන්ගේ ශාරීරික හා මානසික ගති ලක්ෂණ පරම්පරාවට උරුම කරවන ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය ආරයයි.
- දරුවාගේ උත්පත්තිය සඳහා මව සහ පියාගේ දායකත්වය ආරයයි.

- දරුවාගේ ජීවිතය හා බැඳි බාහිර උත්තේජක සියල්ල පරිසරයයි.
- පරිසරය -( සමාජ පරිසරය, භෞතික පරිසරය)
- ආරයෙන් තීරණය වූ පුද්ගල ජීවිතය අනාගතයේ දී කුමන තත්ත්වයක් ගන්නේ ද යන්න රඳා පවතිනුයේ පරිසරයේ බලපෑම අනුවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විශේෂ අවශ්‍යතා ඇති සිසුන්

- සාමාන්‍ය ළමයින්ට වඩා වෙනස් විශේෂ ගැටලු හා සමත්කම් ඇති ළමුන් මේ ගණයට වැටේ.
- කායික ආබාධ, අංග විකල, මානසික ආබාධ, ඉගෙනුමට පසුබට, සෙමින් ඉගෙන ගන්නා, ඉගෙනුමට නොහැකියා සහිත ළමුන් පන්ති කාමරයේ හඳුනා ගත හැකි ය.
- සියලුම ළමයින්ට පොදු වූ අවශ්‍යතා මෙන්ම ඔවුන් ට ම සුවිශේෂ වූ අවශ්‍යතා ද ඇත.
- සෑම ළමයෙක් ම විශේෂ අවශ්‍යතා ඇති ළමුන් ලෙස සැලකේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විශේෂ අවශ්‍යතා ඇති සිසුන්

1. සුහග සිසුන්
2. සෙමින් ඉගෙන ගන්නා සිසුන්
3. අවධානය අඩු සිසුන්
4. සමාජ ආක්‍රමණකාරී සිසුන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පැවරුම්

1.1 පන්ති කාමර කළමනාකරණය ගුරුවරයාට වැදගත් වන ආකාරය කරුණු පහකින් පෙන්වා දෙන්න.

1.2 පහත සඳහන් ශීර්ෂ යටතේ ගුරුවරයාගේ කළමනාකරණ කාර්යයන් දෙක බැගින් දක්වන්න.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
- උපකාරක ඉගැන්වීම
- ප්‍රජා සම්බන්ධතා අන්‍යොන්‍යකරණය
- පන්ති කාමර විනය පවත්වා ගැනීම
- භෞතක හා මානව සම්පත්

2. පහත දැක්වෙන සිද්ධි අධ්‍යයනය කොට, එම ගුරුවරියන්ගේ පන්ති කාමර කළමනාකරණයේ ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පළමුවන සිද්ධිය

- 3 ශ්‍රේණියේ සිසුන්ට හැඩතල හඳුනා ගැනීමේ පාඩමක් ඉගැන්වීමට ගුරුවරියකට අවශ්‍ය විය. මේ සඳහා ඇය විවිධ හැඩතල කට්ටප කිහිපයක් ගෙනැවිත් තිබුණි. සමහර ඒවා ඝන කඩදාසිවලින් සකසා තිබුණි. මේ සියල්ල පන්තියට ගෙන ගොස් මේසය මත තබා පාඩම ආරම්භ කළාය. එක් එක් හැඩය පෙන්වමින් හැඩ හඳුන්වා දුන්නාය. මේ අතරතුර සිසුන් දෙදෙනෙක් නැගිට මේසය ළඟට පැමිණ හැඩතල දෙස ආශාවෙන් බලා සිට කිහිපයක් අතට ගත්හ. අසළම කණ්ඩායම පැමිණ කිහිපයක් රැගෙන ගොස් වාඩි වූහ. කිහිප දෙනෙක් නැගිට මේසය වටා රොක් වූහ. පන්තිය කලබලකාරී විය. අසල්වැසි පන්තියේ ගුරුවරියද දොර ළඟට විත් බාධාකාරී බව හැඟවේවාය. එවිට ගුරුවරිය නිශ්ශබ්ද ව වාඩි වෙන්න යැයි සිසුන්ට අණ දුන්නාය. මේ අතර සීනුව නාද විය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# දෙවන සිද්ධිය

පද්මා නැමති ගුරුවරිය පන්තියට පැමිණියාය. ළමෝ නැගිට සුභ උදෑසනක් වේවා යි ප්‍රාර්ථනා කළහ. ඇයත් පෙරළා ඔවුන්ට සුභ පැතුවාය.

භාෂා ප්‍රහේලිකා සම්බන්ධ තරගයක් පැවැත්වීමට එදින ට නියමිතව තිබුණි. පන්තිය වර්ණ දෙකක් අනුව කාණ්ඩ දෙකකට බෙදන ලදි. එක් එක් කණ්ඩායමට නමක් දී එකිනෙකට මුහුන ලා අසුන් ගැනීමට සලස්වන ලදි. ඉන් පසු ගුරුවරිය පහත දැක්වෙන උපදෙස් ලබා දුන්නාය.

මම සෑම කෙනෙකුටම ප්‍රශ්නයක් ලියා ඇති කාඩ් පත බැගින් දෙනවා. එක් කෙනෙකු අනෙක් කණ්ඩා සාමාජිකයෙකුට ප්‍රශ්නයක් ඉදිරිපත් කළ යුතුයි. සෑම නිවැරදි උත්තරයකටම ලකුණු 10 ක් ලැබෙනවා.

සෑම කෙනෙකුටම ප්‍රශ්න ඇසීමට හා උත්තර දීමට අවස්ථාව දෙන ලදි. අවසානයේ දී ගුරුවරිය ලකුණු එකතු කොට ජයග්‍රාහක කණ්ඩායමට තිළිණයක් ප්‍රදානය කළාය. ඒ සමඟම පිළිතුරු දීමට අපහසු වූ තැන් ද පැහැදිලි කර දෙන ලදි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3. පහත දැක්වෙන ප්‍රියජනක ඉගෙනුමට බාධාකාරී පන්ති කාමර වාතාවරණවලට හේතු , දක්නට ලැබෙන ලක්ෂණ පෙන්වා දී ඒවා හිතකර කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

- 5 ශ්‍රේණිය සිසුන් 30 ක් සිටින පන්ති කාමරයකි. පන්තියේ ඩෙස් පුටු 40 ක් පමණ ඇත. එක් කොණක දෘෂ්‍යාධාර රාශියක් අවිධිමත්ව තබා ඇත. අවශ්‍ය සම්පත් ඇති බවක් පෙණුනත් ඉඩකඩ ඇහිරුණු බවක් ඇත. පන්ති භාර ගුරුතුමිය පවසනුයේ මෙම පන්තියේ ළමයින් ඉගෙනීමට කම්මැලි බවය.
- 10 ශ්‍රේණියේ ගණිත පාඩම් අවසානයේ දෙනු ලබන අභ්‍යාස ඉක්මනින් නිවැරදිව නිම කරන සිසුන් කිහිප දෙනෙකු වේ.ඔවුහු වැඩ නිම කර ගුරුතුමියට පෙන්වා අන් අය සමඟ කථා කරති. කඩදාසි කොළ පාස් කර ගනිති. අනෙක් අයට උසුළු විසුළු කරමින්, ගුරුතුමිය අභ්‍යාස පොත් බලන අතරතුර එහා මෙහා ඇවිදිති. මොවුන් අනෙක් සිසුන්ට බාධාකාරී ලෙස ගුරුතුමියට දැනේ.
- 10 ශ්‍රේණියේ සාහිත්‍ය පාඩම උගන්වන ගුරුවරියට දෙපස පන්තිවල ඝෝෂාකාරී බව බහුලව අත්විදීමට සිදුවේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

4. ගුරුවරයාට සිසුන් හඳුනා ගැනීමේ වැදගත්කම - කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

5.විශේෂ අවශ්‍යතා ඇති සිසුන් වර්ග අතරින් දෙකක් තෝරා ගන්න. එම සිසුන්ගෙන් ප්‍රදර්ශනය වන චර්යා ලක්ෂණ දක්වා එම ලක්ෂණ හඳුනා ගැනීම සඳහා යොදා ගත හැකි උපකරණ සහ අහිතකර චර්යා පාලනය කරමින් ඔවුන් ඉගෙනුමට යොමු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න

6. මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය දක්වා , ද්විතියික අවශ්‍යතා ඉටු කර දිය හැකි පාසල් ක්‍රියාකාරකම් 10ක් දක්වන්න.

7.ප්‍රාථමික අවධිය හා ද්විතියික අවධිය යන පාසල් අවධි , කායික, මානසික, චිත්තවේගික,සමාජයීය වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණ වගුවකින් ඉදිරිපත් කරන්න.